00117

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ

ඩිප්ලෝමා වැඩ සටහන - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

**ESD 1230 – ළමා සංවර්ධනය I**

කාලය - පැය 03 යි.

---

දිනය - 2013.12.01 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

පළමුවන කොටසේ සියළුම ප්‍රශ්නවලටද දෙවන කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

පළමුවන කොටස

01. ළමා සංවර්ධනය පිළිබඳ රූසෝ ඉදිරිපත් කරන ලද මතවාදය කෙටියෙන් දක්වන්න.

02. පියාජේගේ මතවාදයට අනුව අනුවර්තන ක්‍රියාවලිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

03. උපරි සංවර්ධන කලාපය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

04. අන්තර් පුද්ගල බුද්ධිය පුද්ගල ඇතුලාන්ත බුද්ධියෙන් (අන්තඃපුද්ගල බුද්ධිය) වෙන් කොට දක්වන්න.

05. ළමයින්ගේ භාෂා සංවර්ධනය ඉහළ නැංවීම පිණිස ළමයින් රැක බලා ගන්නන්ට දිය හැකි උපදෙස් තුනක් (03) දක්වන්න.

06. රූපවාහිනිය නැරඹීම ළමයින් තුළ අවධාන දුෂ්කරතා ඇතිවීමට බලපෑ හැකිය. මෙම ප්‍රකාශයට පක්ෂව හෝ විපක්ෂව තර්ක කරන්න. අවශ්‍ය තැන්වලදී උදාහරණ සපයන්න.

07. ළමයින් තුළ ස්ව සංකල්පය සංවර්ධනයෙහි ලා බලපෑ හැකි ප්‍රාථමික සාධක දෙකක් (02) නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

08. ළමයින් තුළ මතකය සම්බන්ධ ගැටළු ඇතිවීමට බලපෑ හැකි හේතු තුනක් (03) දක්වන්න.

(ලකුණු 5x8 = 40)

## දෙවන කොටස

09. I. සුදුසු උදාහරණ දක්වමින් ළමා සංවර්ධනයෙහි ලා

i. පරිණතිය සහ ඉගෙනීම සහ

ii. ආරය හා පරිසරය

අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

II. 'පරිණතිය යනු පෙර පාසල් ළමයින්ගේ ඉගෙනීම සඳහා බලපාන එක් වැදගත් සාධකයකි.'

ළමයින්ගේ ඉගෙනුම සම්බන්ධ පරිණතියේ බලපෑම නොසලකා හැරීමේ ප්‍රතිවිපාක උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

10. I. ළමයින්ගේ සමාජ සංවර්ධනයට බලපාන මූලික සාධක තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ බහුතරය සමාජ කුසලතා වල හිඟ බවින් පෙළෙයි.

උක්ත ප්‍රකාශය සුදුසු උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

III. ඔබ පෙර පාසලට ඇතුලත් කර ඇති විශේෂ අවශ්‍යතා සහිත ළමයෙක් ඇතුළු සියළුම ළමයින්ගේ සමාජ කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කර ගත් ක්‍රියාකාරකමක් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

11. I. වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ ඉහළින් අවධාරණය කරනු ලබන බුද්ධි ප්‍රභේද දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

II. සිසුන්ගේ සංවර්ධනයෙහි ලා උක්ත දක්වන ලද බුද්ධි ප්‍රභේද දෙක කෙරෙහි පමණක් සීමා වීමෙහි ප්‍රතිවිපාක සාකච්ජා කරන්න.

(ලකුණු 06)

III. පන්ති කාමරයක් තුළ සිසුන්ගේ විවිධත්වයකින් යුක්ත අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කිරීමෙහි ලා අනෙකුත් බුද්ධි ප්‍රභේද පිළිබඳව අවධාරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

12. I. 'අවධානය' යන පදය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. 'අවධාන ඌණතා අධි ක්‍රියාකාරී අක්‍රමතාවයේ (ADHD) ගති ලක්ෂණ 6 ක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 06)

III. අවධාන ඌණතා අධි ක්‍රියාකාරී අක්‍රමතාව සහිත සිසුවෙකුගේ චර්යාව කළමනාකරණය කිරීමට ගුරුවරයකු විසින් ලබාදිය හැකි සහයෝගය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

13. පහත දැක්වෙන ඕනෑම දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

1. ඩයනා බෝමරින් ඉදිරිපත් කරන ලද දෙමාපිය ශෛලීන්.
2. මිනිස් මොළය සංවර්ධනය සඳහා බලපාන සාදක
3. පෙර පාසල් ළමයින්ගේ මතකය වැඩි දියුණු කිරීම
4. පියාජේ ඉදිරිපත් කරන ලද සිතිවිලි සංවර්ධනය වීමේ අවධි

(ලකුණු 10x2 = 20)

\- හිමිකම් ඇවිරිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2013**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**
**ESD1230 – CHILD DEVELOPMENT I**
**DURATION – THREE (03) HOURS.**

Date: 01st December 2013 Time: 9.30 a.m. 12.30 p.m.

**Answer all the questions in Part I and any three (03) questions from Part II.**

## PART I

01. State briefly the view/points of Rousseau on child development.

02. Explain the process of adaptation in line with Piaget's views.

03. What do you mean by 'the Zone of proximal development"? Explain.

04. Differentiate interpersonal intelligence from intra-personal intelligence.

05. State three (03) advices, that can be given to care givers in order to promote language development of children.

06. "Watching TV would lead to attention difficulties in children" Argue for or against this statement. Give examples wherever necessary.

07. Name **two(02)** primary factors which influence the development of self concept in children and explain one of them.

08. State **three (03)** reasons leading to memory problems in children.

(8 x 5 = 40 marks)

## PART II

09. i. Citing suitable examples, explain the relationship between

a. Maturity and learning

and

b. Heredity and environment.

In relation to child development.

(12 marks)

ii. "Maturity is one of the important factors affecting learning of pre-school children. Explain with examples the consequences of undermining the impact of maturity on their learning.

(08 marks)

10. i. Explain three (03) basic factors influencing social development of children.

(06 marks)

ii. 'The majority of children with special needs lacks social skills' Analyse the above statement using suitable examples.

(07 marks)

iii. Explain an activity aimed at improving social skills of all children in your pre-school classroom including a child with special needs.

(07 marks)

11. i. Name two types of intelligences that are highly emphasized in the current education system.

(04 marks)

ii. Discuss the consequences of limiting the focus on the two types of intelligence state above inline with the student development.

(06 marks)

iii. Explain the importance of emphasizing the other types of intelligence in addressing the diverse needs of students in the class room.

(10 marks)

12. i. Explain the term 'attention' in your own words.

(05 marks)

ii. List out 6 characteristics of the 'Attention Deficit Hyperactive Disorder' (ADHD)

(06 marks)

iii. Citing examples explain the support that can be given by a teacher to a child with ADHD to manage his/her behaviours.

(09 marks)

13. Write short notes of any two of the following.

i. Parenting styles presented by Diana Baumrind.

ii. Factors affecting the development of human brain.

iii. Promoting memory in pre-school children.

iv. Stages of development of thought presented by Piaget.

(10 x 2 = 20 marks)

- *Copyrights reserved* -